## නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයට අයත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තු), III ශ්‍රේණිය තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම - 2018

නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයට අයත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තු), III ශ්‍රේණිය තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති නැගෙනහිර පළාතේ සේවයේ නියුතු ප්‍රජා සංවර්ධන නිලධාරී විශේෂ ශ්‍රේණියේ හෝ විමර්ශන නිලධාරී විශේෂ ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2019.01.11** දින වේ.

**02. බඳවා ගැනීම සඳහා වන සේවා කොන්දේසි :-**

2.1 මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව සේවා කොන්දේසි තීරණය කරනු ලැබේ.

2.2 මෙම දැන්වීමට අනුව ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන් වෙනුවෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත බඳවා ගනු ලැබේ.

2.3 මෙම පත්වීම් ලබන අය නැගෙනහිර පළාතේ කවර ප්‍රදේශයක වුවද සේවය කළ යුතුය. එමෙන්ම නැගෙනහිර පළාතේ වසර 10ක අනිවාර්ය සේවා කාලයක් සම්පූර්ණ කළ යුතුවේ.

2.4 ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් කිරීමට අපේක්ෂා ප්‍රජා සංවර්ධන නිලධාරී, විශේෂ ශ්‍රේණිය හෝ විමර්ශන නිලධාරී, විශේෂ ශ්‍රේණිය නිලධාරීන් තමන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තෝරා ගන්නා අය නිදහස් කිරීමට එකඟතාවය පළ කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිර්දේශ නොකර ඉදිරිපත් කරන අයදුම්පත් පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**03. වැටුප :-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 ට අනුව,(SL 1-2016)
රු. 47,615 - 10x1,335 - 8x1,630 - 17x2,170 - රු. 110,895/- වේ.

2016.01.01 දින සිට ගෙවීම් සිදුකරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි II වන උපලේඛනය අනුව වේ. මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 වන දින සිටය.

**04. පොදු සුදුසුකම්:-**

අයදුම්කරුවන් ඉහත සඳහන් තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**05. බඳවා ගැනීමේ ක්‍රමය :-**

5.1 නැගෙනහිර පළාත් සභාව සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියට, රජයේ චක්‍රලේඛවලට හා ඉහත 2.2 හි විධිවිධානවලට අනුකූලව බඳවා ගනු ලැබේ. අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවා, මෙම දැන්වීමෙහි සඳහන් සුදුසුකම් සියල්ල පරීක්ෂා කරනු ලබන අතර, අවශ්‍ය සුදුසුකම් නොමැති බව හෙළිවුවහොත් තනතුර සඳහා වන හිමිකම අවලංගු කරනු ලැබේ.

5.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවා මෙම තනතුර සඳහා පත්කරනු ලැබේ.

5.3 සෑම අයදුම්කරුවකුම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර තනතුරට අදාළ සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිම අනිවාර්ය වේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර නියමිත සුදුසුකම් වලට අදාළ පරීක්ෂණවල ප්‍රතිඵල ද නිලවශයෙන් නිකුත් වී තිබිය යුතුය. ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින අය අයදුම් කිරීම වරදක් සේ සලකනු ලබන අතර, සුදුසුකම් නොමැතිව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**06. ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :-**

අයදුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නීතිරීති අනුව, යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙද්දී හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් ඕනෑම අවස්ථාවකදී ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන. ඉහත 5.3 පිළිබඳ අයදුම්කරුවන්ගේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

**07. අයදුම්කිරීමේ ක්‍රමය ඃ-**

7.1 මෙම දැන්වීමෙහි අවසානයේ යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4(සෙ.මී.21x29) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම **පමණක්** ප්‍රයෝජනයට ගනිමින් **අංක 1.0 සිට 8.0 දක්වා පළමු පිටුවටද, අංක 9.0 සිට 12.0 දක්වා දෙවන පිටුවටද** ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය.

7.2 **නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නිවැරදිව සම්පූර්ණ කර නොමැති, ආදර්ශ අයදුම්පත්‍රයේ ඇති විභාග සංකේත අංකය නොමැති, අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ එදිනට පෙර ඉදිරිපත් කර නොමැති අයදුම්පත් සහ අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.** නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන අලාභය අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු සැලකිලිමත් විය යුතුය. එසේ නොවුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

7.3 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාග සංකේත අංකය **EX/Rec/18/10** යන්න සඳහන් කළ යුතුය.

7.4 අයදුම්පත්‍රයේ ඇති අයදුම්කරුගේ අත්සන දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියා/දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරියේ අත්සන් කොට, එම අත්සන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියා/දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර, දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික කර එවිය යුතුය.

7.5 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2019.01.11** වැනි දින හෝ එදිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තැපෑලේදී අස්ථානගතවන අයදුම්පත්‍ර පිළිබඳ කිසිදු වගකීමක් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාරගනු නොලැබේ. **(ඉල්ලුම්පත්‍ර ලේකම්වරයාගේ පෞද්ගලික නමට එවීමෙන් වැළකිය යුතුය.)**

**ලේකම්,**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**නැගෙනහිර පළාත,**
**අංකඃ 198, ඇතුල් වරාය පාර,**
**ත්‍රිකුණාමලය.**

**08.** අයදුම්කරුවන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

**i.** ජාතික හැඳුනුම්පත. **ii.** වලංගු විදේශ ගමන් බලපත්‍රය. **iii.** වලංගු රියදුරු බලපත්‍රය.

**09.** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී පවත්වනු ලැබේ.

- **බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂයේදී ලකුණු ලබාදෙන ආකාරයඃ-**

**i. වයස් සීමාව ඃ-**

සීමිත පදනම මත බඳවා ගැනීමේදී උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**ii.** **අධ්‍යාපන සුදුසුකම් ඃ-**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

**iii.** **යෝග්‍යතාව ඃ-**

(අ) නැගෙනහිර පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ප්‍රජා සංවර්ධන නිලධාරී, විශේෂ ශ්‍රේණියේ හෝ විමර්ශන නිලධාරී, විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතුය.

(ආ) නැගෙනහිර පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ඉහත සඳහන් කරන ලද තනතුරුවල විශේෂ ශ්‍රේණියේ වසර තුනකට නොඅඩු (03) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ කිසිදු වරදකට දඬුවම් නොලබා තිබිය යුතුය.

**iv.** **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය ඃ-**

| **ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ** | **උපරිම ලකුණු** |
|---|---|
| **01. ජ්‍යෙෂ්ඨත්වය**<br>i. ප්‍රජා සංවර්ධන නිලධාරී හෝ විමර්ශන නිලධාරී විශේෂ ශ්‍රේණියෙහි වසර තුනකට (03) වැඩියෙන් සම්පූර්ණ කරන ලද සෑම වසරක් සඳහාම ලකුණු හතරක් (04) ලබාදෙනු ලැබේ.<br>ii. ප්‍රජා සංවර්ධන නිලධාරී හෝ විමර්ශන නිලධාරී විශේෂ ශ්‍රේණියෙහි වසර තුනකට (03) වැඩියෙන් සම්පූර්ණ කරන ලද මාස නවයකට (09) නොඅඩු වසරකට (01) නොවැඩි කාලයක් සඳහා ලකුණු තුනක් (03) ලබාදෙනු ලැබේ.<br>iii. ප්‍රජා සංවර්ධන නිලධාරී හෝ විමර්ශන නිලධාරී විශේෂ ශ්‍රේණියෙහි වසර තුනකට (03) වැඩියෙන් සම්පූර්ණ කරන ලද මාස හයකට (06) නොඅඩු එහෙත් මාස නවයකට (09) නොවැඩි කාලයක් සඳහා ලකුණු දෙකක් (02) ලබාදෙනු ලැබේ.<br>iv. ප්‍රජා සංවර්ධන නිලධාරී හෝ විමර්ශන නිලධාරී විශේෂ ශ්‍රේණියෙහි වසර තුනකට (03) වැඩියෙන් සම්පූර්ණ කරන ලද මාස තුනකට (03) නොඅඩු එහෙත් මාස හයකට (06) නොවැඩි කාලයක් සඳහා එක් ලකුණක් (01) ලබාදෙනු ලැබේ.<br>v. විශේෂ ශ්‍රේණියෙහි වසර තුනක් (03) සම්පූර්ණ කිරීමෙන් පසු , මාස තුනකට (03) අඩු කාලසීමාවක් සඳහා අමතර ලකුණු ලබාදෙනු නොලැබේ. | **40** |
| **02. පළපුරුද්ද**<br>i. ප්‍රජා සංවර්ධන නිලධාරී හෝ විමර්ශන නිලධාරී විශේෂ ශ්‍රේණියෙහි නිලධාරියෙකු විසින් පළාත් පාලන සහකාර කොමසාරිස් තනතුරේ වැඩබලන රාජකාරී සිදුකළ සෑම සම්පූර්ණ වසරක් (01) සඳහාම ලකුණු තුනක් (03) බැගින් ලබාදෙනු ලැබේ.<br>ii. ප්‍රජා සංවර්ධන නිලධාරී හෝ විමර්ශන නිලධාරී විශේෂ ශ්‍රේණියෙහි නිලධාරියෙකු විසින් පළාත් පාලන සහකාර කොමසාරිස් තනතුරේ | **15** |

| | |
|---|---|
| වැඩබලන රාජකාරී සිදුකළ මාස හයකට (06) නොඅඩු එහෙත් වසරකට නොවැඩි කාලයක් සඳහා ලකුණු දෙකක් (02) ලබාදෙනු ලැබේ.<br><br>iii. ප්‍රජා සංවර්ධන නිලධාරී හෝ විමර්ශන නිලධාරී විශේෂ ශ්‍රේණියෙහි නිලධාරියෙකු විසින් පළාත් පාලන සහකාර කොමසාරිස් තනතුරේ වැඩබලන රාජකාරී සිදුකළ මාස තුනකට (03) නොඅඩු එහෙත් මාස හයකට (06) නොවැඩි කාලයක් සඳහා එක (01) ලකුණක් ලබාදෙනු ලැබේ.<br><br>iv. පළාත් පාලන සහකාර කොමසාරිස් තනතුරේ වැඩබලන රාජකාරී සිදුකළ මාස තුනකට (03) අඩු කාලසීමාවක් සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ. | |
| **03. අතිරේක අධ්‍යාපන සුදුසුකම්**<br>i. නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනයකින් ලබාගත් පශ්චාත් උපාධියක් සඳහා ලකුණු දහයක්(10) සහ නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනයකින් ලබාගත් එක් අවුරුද්දක (01) ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා ලකුණු පහක් (05) ලබාදෙනු ලැබේ.<br><br>ii. තනතුරේ අභිවෘද්ධිය උදෙසා පිළිගත් ආයතනයකින් ලබාගත් එක් එක් ඩිප්ලෝමාව සඳහා ලකුණු එක (01) බැගින් ලබාදෙනු ලැබේ. එම ලකුණු ප්‍රමාණය පහකට (05) සීමා වේ. | **20** |
| **04. වෙනත් සුදුසුකම්**<br>සහභාගී වී ඇති එක් එක් විදේශ පුහුණු /ජාතික සමුළු /පුහුණු කඳවුරු /අධ්‍යයන චාරිකා/ස්වාධීන පර්යේෂණ /දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කරන ලද ව්‍යාපෘති යෝජනා සඳහා එක් සතියකට(01) ලකුණු දෙකක් (02) බැගින් ලබාදෙනු ලැබේ. | **20** |
| **05. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය** | **05** |
| **මුළු ලකුණු** | **100** |

මෙම දැන්වීමෙහි සඳහන් විධිවිධානවල කිසියම් සංශෝධනයක් අවශ්‍ය වුවහොත් ඒ සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ. එමෙන්ම මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය යම් විශේෂ හේතුවක් මත නොපැවැත්වීමේ අවශ්‍යතාවයක් පැන නැගුනහොත් ඒ පිළිබඳව ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ. එසේම මෙම තනතුරෙහි පවතින පුරප්පාඩුව පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසාන තීරණය ගැනීමේ බලය නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ /නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් මත පත්කිරීම් බලධාරියා සතු වේ.

**එම්.වයි.සලීම්,**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත,
ත්‍රිකුණාමලය.

**EX/Rec/18/10**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

ආදර්ශ අයදුම්පත්‍රය

**නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයට අයත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තු), III ශ්‍රේණියේ තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම - 2018**

භාෂා මාධ්‍යය
සිංහල - S දෙමළ - T ☐
*(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)*

ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ……………………………………

**1.0** 1.1 මුලකුරු සමඟ නම : Rev/Mr/Mrs/Miss ……………………………………………………………
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් අගට යෙදෙන නම මුලින් ලියා මුලකුරු පසුව ලියන්න - උදා : PERERA, A.B.C.)*

1.2 මුලකුරු වලින් හැඳින්වෙන නම් : ……………………………………………………………
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ……………………………………………………………

1.3 සම්පූර්ණ නම : ……………………………………………………………
*(සිංහලෙන්/දෙමළෙන්)* ……………………………………………………………

1.4 ස්ත්‍රී/පුරුෂ භාවය ස්ත්‍රී - F පුරුෂ - M ☐
*(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)*

1.5 දුරකතන අංකය : ……………………………………………………………

**2.0** 2.1 ස්ථිර ලිපිනය : ……………………………………………………………
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ……………………………………………………………

2.2 ස්ථිර ලිපිනය : ……………………………………………………………
*(සිංහලෙන්/දෙමළෙන්)* ……………………………………………………………

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය : ……………………………………………………………
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ……………………………………………………………

**3.0** 3.1 ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් නම්, ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐☐☐

3.2 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 **2019.01.11** දිනට වයස : වර්ෂ ☐☐ මාස ☐☐ දින ☐☐

**4.0** ජනවර්ගය : සිංහල ☐ ශ්‍රී ලාංකික දෙමළ ☐ මුස්ලිම් ☐ වෙනත් ☐
*(අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න)*

**5.0** අධ්‍යාපන සුදුසුකම් :
අයදුම්කරු පිළිගත් විශ්ව විද්‍යාලයකින්/ආයතනයකින් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් ලබා ඇත්නම්,

(i) විශ්ව විද්‍යාලයේ/ආයතනයේ නම : ……………………………………………
(ii) උපාධිය/ඩිප්ලෝමාව : ……………………………………………
(පංති සාමාර්ථයක් ඇත්නම් සඳහන් කරන්න)
(iii) උපාධි/ඩිප්ලෝමා සහතිකය වලංගු වන දිනය : ……………………………………

**6.0** ජ්‍යෙෂ්ඨත්වය : ……………………………………………………………

**7.0** පළපුරුද්ද : ……………………………………………………………

**8.0** ඔබ ශ්‍රී ලංකාවේ උසාවියකින් කවර හෝ අපරාධ වරදකට වරදකරු කරනු ලැබ තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න. : ……………………………………………………………

**9.0** නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත ප්‍රජා සංවර්ධන නිලධාරී/විමර්ශන නිලධාරී අයෙකු නම් ඃ-

9.1 වර්තමාන තනතුර : ……………………..……………………………………………….

9.2 වර්තමාන ශ්‍රේණිය : ……………………..……………………………………………….

9.3 කාර්යාලය : ……………………..……………………………………………….

9.4 මුල්පත්වීම් දිනය : ……………………..……………………………………………….

9.5 වර්තමාන තනතුරෙහි සේවා කාලය : ……………………..……………………………………………….

9.6 මුළු සේවා කාලය : ……………………..………………………………………………

**10.0 අයදුම්කරුගේ සහතිකය**

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ ම'විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) ම'විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) තවද, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිඳු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : ……………………..……  ..……………………..………………………..……

අයදුම්කරුගේ අත්සන

**11.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම** (මෙම දැන්වීමෙහි 7.4 අනුව)

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන …………………………………..……………..මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ……………....………… දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

…………………………………………….

අත්සන සහතික කරන්නාගේ අත්සන

දිනය : ……………………..……

සහතික කරන්නාගේ නම : ……………………..……

තනතුර : ……………………..……

ලිපිනය : ……………………..……

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

**12.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම්කරු/අයදුම්කාරිය වන……………………………………………… මහතා/මහත්මිය/මෙනෙවිය මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත අයකු බව ද, ඔහු/ඇය ස්ථිර තනතුරක් දරමින් සිටින බව ද, ඔහු/ඇය 2019.01.11 දින වන විට නැගෙනහිර පළාත් …………………………………….. සේවයේ විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලැබ ඇති බව ද, විශේෂ ශ්‍රේණියට අදාළ උසස්වීම් ලිපියක් ඔහුට/ඇයට නිකුත් කර ඇති බව ද, ඔහු/ඇය 2019.01.11 වැනි දින හෝ එදිනට පෙර වසර 03 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බව ද, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම 2019.01.11 වැනි දිනට පූර්වාසන්න අවුරුදු 03 ඇතුළත සතුටුදායකව පැවැති බව ද, මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරනු ලබන බව ද, ඔහුගේ/ඇයගේ අයදුම්පතෙහි දැක්වෙන විස්තර මෙම දෙපාර්තමේන්තුවේ ඇති ලේඛන සමග හරි වැරදි බලා ඇති බව සහ මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට අදාළ විභාග නිවේදනයේ දැක්වෙන රෙගුලාසි අනුව මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට ඔහු/ඇය සුදුසු බව ද, මම සහතික කරමි.

…………………………………………….

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

දිනය : ……………………..……

නම : ……………………..……

තනතුර : ……………………..……

ලිපිනය : ……………………..……

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)